සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / **Paper**: I | කාලය / காலம் / **Time**: පැය 03 |

සැලකිය යුතුයි:

- **I** කොටසෙහි 01, 02 ප්‍රශ්නවලටත් **II** කොටසෙහි 03 වන ප්‍රශ්නයටත් **III** කොටසෙහි 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් උත්තර ලියන්න.

## I කොටස

(01) අංක (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා අසා ඇති (අ , ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) එබස් අසා සතුටු වූ බිසව් ' දේවයන් වහන්ස පුත්‍රවරයක් දුන මැනවැ ' යි ඉල්වූ ය.

(අ) මෙහි සඳහන් බිසව් කවුරුන් ද?

(ආ) පුත්‍ර වරයක් ඉල්ලා සිටියේ කාගෙන් ද?

(ii) නපුරු කලට සතහට පැමිණෙත වෙහෙස
එදුරු නොවෙයි කළ පව් පල දෙවා මිස
**තඹුරු වනය මුකුලිත** වන බව සවස
කවුරු විසින් වැළකිය හැකි **මෙ දිය කුස**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මේ කවිය උපුටා ගත් ග්‍රන්ථය ලියූ යුගය කුමක් ද?

(iii) ''මල්ලියේ මට වෙසක් කාඩ් දෙක තුනක් ඇඳල දෙනවද මම පෝස්කාට් ගෙනත් දෙන්නං.''

(අ) මෙහි මල්ලියේ යැයි ආමන්ත්‍රණය කළේ කාට ද?

(ආ) මේ කොටස උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

(iv) මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයාදි රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

(අ) මේ කවි පාදවල සඳහන් උපමාවක් උපුටා දක්වන්න.

(ආ) මෙහි කියවෙන මා සහ ඔබ යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?

(v) ' මෙවක් පටන් මහණ වන්ට මවුපියන් අනු නොදත් දරුවන් මහණ නොකරන්ට විධානයක් ඇත. මැනවැ ' යි.

(අ) මෙසේ පවසන්නේ කවුරුන් ද?

(ආ) එලෙස කීමට හේතුව කුමක් ද?

(ලකුණු 4 × 5 = 20)

(02) පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

මඟක් නම්
පියවර මතින්
පියවර තබා
තැනු මඟක් ම යි
අතර මග ළත නොවී
මුව දොර සොයා යන
ගඟක් ම යි.

සිය දහස්
කෝ වේ හමුවනා
මං සන්ධි පසුවන
අතවනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා

මඟක් දොසක් නොකියන්
නැත ඊට නිසි කාරණා
අම්බලම්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදිකා මල් වැටෙන්
සෙවණලු සදන
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

මොහොතක ඉසිඹු
ලබනා විනා
නැත අතරමග
නතරවන වාසනා
මඟක් නම්
ඒ මඟක් ම යි
නොමඟක් නොවෙයි
මග නවතින

(1) පැදි පෙළට පාදක වූ අත්දැකීම කෙබඳු ද?

(2) කාව්‍ය අලංකාර මගින් එම අත්දැකීම් රසවත් කර ඇති අයුරු

(3) සංකේතාත්මක භාෂාවේ අපූරු බව

(4) කාව්‍ය ආකෘතියේ උචිත බව

(5) පැදි පෙළ මගින් ව්‍යංග්‍යාර්ථවත් වන ජීවන දෘෂ්ටිය (ලකුණු 25)

## II කොටස

(03) පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක කොටසකට පමණක්** උත්තර සපයන්න.

එක වරෙකින් වඩාත් නුපදනා ලෙස කොට ලා අනික් ගාථාවෙකින් මහා ප්‍රජාපතී ගෝතමී නම් කුඩා මෑණියන්දෑගෙන් පූ තන කිරෙහි කිරි මිල ගෙවාලන්නාක් මෙන් උන්දෑ සෝවාන් කරවා පියරජ්ජුරුවන් තනතුරෙන් වඩාලන්නා සේ සෙදගැමි කරවා, එම දවස් වළඳා අන්තයෙහි බිම්බා බිසොවුන්ගේ ගුණයෙහි තරම මහෞෂධ පණ්ඩිත අවස්ථාවෙහිත් විමසා තිබූ හෙයින් වදාරනු නිසා චන්දකිණ්ණර ජාතකය වදාරා, ඊට දෙවන දවස් නන්ද කුමරුන්ට වොටුනු මඟුලත්, ගෙවදනා මඟුලත්, විවාහ මඟුලත් තුන එක අවධියට පැමිණි කල්හි, මේ මඟුල් තුනට වඩා නිවන් මඟුල උතුම් බැවින් ඒ උන්ට පමුණුවා ලමී නුවරට සිඟා වැඩ සිඟා අන්තයෙහි නිවන් අත්පත් වන ලෙසින් පාත්‍ර ධාතුන් වහන්සේ අතට දීලා ආදියෙන් යන ගමනට ඉෂ්ට සූචක කොට දුන් පාත්‍රය හෙයින් පාත්‍රය අතරට හැර නො ගත් සේක. නන්ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනව' යි නොකියා රජ ගෙන් වඩනා ගමන හෙයින් හිණි හිස කෙරෙහි දී හැරගන්නා සේකයි සිතූහ. බුදුහු එතන දීත් පාත්‍රය හැර නොගත් සේක් හිණි පා මුල දී හැර ගන්නා සේක් වනැ යි සිතා යන කලට එතන දීත් හැර නොගන්නා රඳනු කැමතිවත් අභිප්‍රායකින්ම නොව බුදුන් කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනව යි කියා ගත නොහී මෙතනදී හැර ගන්නා සේක. මෙතනදී හැර ගන්නා සේක් වනැ යි සිතා ම නොසිතින් ගියත් සිතින් ම සසර ගමනින් නවත්නා හෙයින් යෙත් ම ය.

(1) බුදුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කළ ගමනේ සිදු කළ කටයුතු මොනවා ද? (ලකුණු 05)
(2) මෙහි දැක්වෙන පරිදි නන්ද කුමරුන්ගේ ජීවිතයේ විශේෂ අවස්ථා මොනවා දැයි ඡේදයෙන් උපුටා දක්වන්න. (ලකුණු 05)
(3) බුදුන් වහන්සේ නන්ද කුමරුන්ට යහපතක් කරන්නට සිතුවේ කෙසේ ද? (ලකුණු 05)
(4) සද්ධර්මරත්නාවලී කතුවරයා බුදුන් වහන්සේගේ කිඹුල්වත් නුවරට වැඩමවීමේ අසිරිමත් සිදුවීම් රසවත් ලෙස ඉදිරිපත් කර ඇති ආකාරය ඡේදය ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

(ලකුණු 25)

**නැතහොත්**

(ආ) උපන්නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එයින් පිටස්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

නම්බුව කැමති අය ඇති නම් නො වී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලොම් සිදුරක තරම් වත් අඩ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උපන් ගමේ බල උරුමය රැක ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙන් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉතින් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

වඳින්නේ නැති ව ලොකු නිලධාරින් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අතත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
කතත් කමක් නැහැ බයසුලු ගතිය පපා
අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල් ලම
අපේ අතට අවනත කර ගෙන වහම
අපේ නමට සලකන දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමගි සැපා
සොලවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරීන්ට විශ්වාසය දෙන්ට එපා

(1) මෙම පද්‍ය පන්තියට කවියා වස්තු විෂය කර ගෙන ඇත්තේ කුමක් ද? (ලකුණු 05)

(2) සැවොම සමගියෙන් බැඳී එක්විය යුතු බව දක්වා ඇත්තේ කෙසේ ද? (ලකුණු 05)

(3) අයුක්තියට එරෙහි විය යුත්තේ කෙසේ දැයි කවි පෙළේ දැක්වෙන්නේ කුමන ආකාරයට ද? (ලකුණු 05)

(4) 'මෙම පද්‍ය පන්තියෙන් දේශාභිමානය ඇති වන ලෙස භාෂාව භාවිත කර ඇති අයුරු අපූරු ය.' විමසන්න. (ලකුණු 10)

(ලකුණු 25 යි)

**<u>III කොටස</u>**

**මෙම කොටසෙහි ප්‍රශ්න 02කට පමණක් උත්තර සපයන්න. (එක් උත්තරයකට වචන 150ට නො අඩු විය යුතුයි.)**

(04) පබාවතීගේ චරිතයේ අහංකාර ස්වභාවය ජාතක කතාකරු නිරූපණය කර ඇති අයුරු 'කුස ජාතකය' ඇසුරින් උදාහරණ ගෙන විස්තර කරන්න. (ලකුණු 15)

(05) 'වෙසක් පහන' කෙටි කතාව මගින් පාඨකයින්ට රසවත් හැඟීමක් ඇති කරවීමට කතුවරයා යොදාගත් දෘෂ්ටිකෝණය කෙතරම් දුරට ඉවහල් වී ඇත් දැයි උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 15)

(06) 'සුභාෂිතය' මගින් ලබා දෙන උපදෙස් සඳහා සත්ත්ව චරිත ඇසුරු කර ගැනීම කෙතරම් උචිත දැයි උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(07) 'අපූරු සංකල්ප රූප ඇසුරු කර ගැනීම, 'අලුත ගෙනා මනමාලිය' පද්‍ය පන්තියේ සාර්ථක බවට ඉවහල් වී ඇත.' උදාහරණ ඇසුරින් විමසන්න. (ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** |

(01) (i) (අ) සීලවතී බිසව
(ආ) ශක්‍රදේවේන්ද්‍රයාගෙන්

(ii) (අ) නෙළුම් විල, මේ ලෝකය තුළ
(ආ) සීතාවක යුගය

(iii) (අ) සිරිසේන
(ආ) තුංමං හන්දිය

(iv) (අ) මේසය මත හිඳිනා ගල සේ
(ආ) මං - කවියා / මිතුරා
ඔබ - දිසාපති

(v) (අ) සුදොවුන් රජ
(ආ) රාහුල කුමරුන් නොකියා ම මහණ කළ නිසා (ලකුණු 4 × 5 = 20)

(02) (1) අත්දැකීම -
ජීවිතයක් ගලා යන අන්දම ප්‍රකාශ කරමින් පියවරින් පියවර ගමන් කරන මාර්ගයක් මගක් උපයෝගී කර ගැනීම. (ලකුණු 05)

(2) අත්දැකීම රසවත් කිරීමට යොදාගෙන ඇති කාව්‍යාලංකාර
උපමා - මගක් නම් - පියවර මතින් - පියවර තබා
- තැනූ මඟක්මයි - මුවදොර සොයා යන ගඟක් මයි
රූපක - විසිතුරු සල්පිල් - වටරවුම් පදිකා
ව්‍යංග්‍යාර්ථ - අතරමඟ ලත නොවී මුව දොර සොයා
යන ගඟක් මයි
මොහොතක් ඉසිඹු ලබනා විනා
නැත අතරමඟ නතරවන වාසනා (ලකුණු 05)

(3) සංකේතාත්මක භාෂාවේ අපූරු බව
මග සංකේත කරමින් රචනා කර ඇති බව
අම්බලන් විසිතුරු - සල්පිල් - ගංගාවන් ආදිය (ලකුණු 05)

(4) ආකෘතියේ උචිත බව
නිසඳැස් ආකෘතිය මගක් පාරක් ආකාරයට
කවිපෙළ පෙළ ගස්වා ඇති අයුරු ප්‍රකාශ කිරීම (ලකුණු 05)

(5) ජීවන දෘෂ්ටිය -

ජීවිතයක් ගලා යන ආකාරය ගඟක් මුහුදක් ලෙස ජීවිතයේ ගැටලු කරදර හමු වී වෙන් වී යයි මං සන්ධිවලින් වෙන් වන්නා සේ නවාතැන් ගැනිම අම්බලන් විසිතුරු සල්පිල්............. මෙහොතක් ඉසිඹුලැම..................... හති අරිමින් ගමන් කිරීම. (ලකුණු 05)

(ලකුණු 25 යි)

## II කොටස

(03) (1) ප්‍රජාපති ගෝතමී බිසව සෝවාන් කරවීම, සුදොවුන් රජු සකෘදාගාමී කරවීම බිම්බා බිසවට චන්ද කින්නර ජාතකය දේශනා කිරීම. (ලකුණු 05)

(2) වොටුනු මඟුලත්, ගෙවදනා මඟුලත්, විවාහ මඟුලත් (ලකුණු 05)

(3) වොටුනු මඟුලත්, ගෙවදනා මඟුලත්, විවාහ මඟුලටත් වඩා එම ත්‍රිත්වය එක අවධියකට පැමිණි කල්හි නිවන් මඟුල උතුම් බැවින් උන්ට පමුණුවාලමි' යි සිතීම. ඒ සඳහා ඔහු කැඳවාගෙන යාම. (ලකුණු 05)

(4) ප්‍රජාපතී කුඩා මෑණියන්ට පු තන කිරි මිල ගෙවාලකන්නාක් සේ, පිය රජ්ජුරුවන් තනතුරෙන් වඩාලන්නා සේ - උපමා

බිම්බා බිසවුන්ගේ තරම මහෞෂධ පණ්ඩිතයන් අවස්ථාව ගෙනහැර පෙන්වා දීම.

උපමා භාවිතය මගින් අවස්ථා රසවත් වීම.

නන්ද කුමරුන් රැගෙන යන ගමනේ විස්තර නොසිතින් ගියත් සිතින්ම සසර ගමනින් නවත්නා හෙයින්............ (ලකුණු 10)

(ලකුණු 25)

නැතහොත්

(1) වස්තු විෂය - යටත් විජිත සමයේ සමාජ අවශ්‍යතාවයක් මුල්කර ගනිමින් ජනතාවට තම යුතුකම් ඉටු කිරීම පිළිබඳව (ලකුණු 05)

(2) සියලුදෙනා එකමුතු වී ලොම් සිදුරක් තරම්වත් අඬදබර නොකර ජයගැන්මට එකතු විම.

(ලකුණු 05)

(3) අතක් පයත් ඔලුවත් වෙන වෙන ම කපාගෙන ගියත් කැවත්, බියගුලු ගතිය අත්හැර අයුක්තියකට අත් ඔසවන්නට එපා යනුවෙනි. (ලකුණු 05)

(4) හැඟීම් දනවන භාෂාවක්

අභිමානයෙන් රට වෙනුවෙන් නැඟිටීමට දිරිගැන්වීම

සරල ව්‍යවහාර භාෂාව

විධි ක්‍රියා මිශ්‍ර භාෂාව

කවි උදාහරණ ලෙස ගනිමින් ලියා තිබීම වඩා හොඳයි. (ලකුණු 10)

(ලකුණු 25)

## III කොටස

(04) ● '' ඇත් ඉලත්තියෙන් ගැසූ විට රජ්ජුරුවන් වහන්සේට කියා අත කප්පාලම්............
දුර්මුඛ වූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම්ද ආදී ආඩම්බර කතා.............

- වළන් සක්සකොට දීමේ දී ඒවා ප්‍රතික්ෂේප කිරීම............
  ගොතන ලද මල්මාලා කිපී බිම දැමීම.......... අහංකාර බව පෙන්වීම
- කුස රජුට තමා අත්හරින ලෙස පැවසීම '' මෙහි සිට දුක් නොවිඳ නුඹ වහන්සේගේ කුසාවතී නුවරට නැඟී ගොස් මා කෙරෙහි................ ''
- නුඹ වහන්සේ වැනි හකුරු පුවක් සේ ආදී කතා කීම.
- ඇය අවසානයේ බෝසතාණන්ගෙන් සමාව අයැදීම. (ලකුණු 15)

(05) උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය

- නංගී සමග වෙසක් පහන සාදන අයුරු බලා සිටීම '' අම්මාගෙන් තැලුම් කා හඬන්ට වූ අපි ආලින්දයේ මුලු දෙකකට වීමු.
- ''ඔව් නංගී අපේ කූඩුව තරම් ලස්සන කූඩුවක් නැහැ............''
- අයියාගේ බැනියමට ගිනි ඇවිලුණු විට නංගීත් මාත් ආරම්භ කළ ඇඬුම අපි නොනැවැත්වීමු.....
- කරත්තය පමා වන්නේ අයියා දොස්තර ගෙදරදී මළ හෙයිනැ' යි මට සිතිණි.
  ආදී ළමා මනසේ ක්‍රියාකාරීත්වය දෘෂ්ටි කොණය මගින් රසවත්ව ඉදිරිපත් වී ඇති බව

(ලකුණු 15)

(06) විපුල ගුණැති මහතුන් හට පත් විපත..........
කුරිරු ගොරසපුන්ගේ දළ ගෙහි විසය.........
පරසිඳු පබු දනන් සෙව් පමණින් මහරු............ සතුන්ගේ චර්යා ඇසුරින් උපදෙස් ලබා දීමට හැකි වී ඇති බව. (ලකුණු 15)

(07) මනාලිය පිළිබඳ කවියාගේ සිතුවිලි පාඨක සිතේ සංකල්පනා මවා පායි -

හිසනමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවාගති

දූල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඇය ගේ පුරා ඇවිදින විට දූනෙන සිතුවිලි

මා වෙත එතත් ඈ
වුවමනාවක් කිසිත් නැතිවද
නොරැඳෙයි, පලා යයි..

පෙනෙයි ඈ
ඇසෙයි
දූනෙයි
මට ගේ හැමතැන

ඉහත කවි පාද සංකල්ප රූප මවා පායි. කවියා අත්දැකීම් රසවත් ව සාර්ථක ව රචනා කිරීමට මේ අපූරු බව ඉවහල් කරගෙන ඇත. (ලකුණු 15)

**පිරිවිතර වගුව**

**සාහිත්‍ය රසාස්වාදය** **11 ශ්‍රේණිය**


| | අධ්‍යාපනික අරමුණු විෂය ක්ෂේත්‍රය / නිපුණතා මට්ටම | දැනුම | අවබෝධය | භාවිතය | විශ්ලේෂණය | සංස්ලේෂණය | ඇගයීම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1.0 සිංහල සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය. | 01 | 01 | | | | | 02 |
| 2 | 5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රස විඳිමින් විචාරය කිරීම. | | | | 01 | | | 01 |
| 3 | 2.0 - 5.0 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය හා නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කිරීම. | | | 01 | | | | 01 |
| 4 | 2.0 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | | | 01 | 01 |
| 5 | 3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | | 01 | | 01 |
| 6 | 2.0 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | | | 01 | 01 |
| 7 | 5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය | | | | 01 | | | 01 |
| | එකතුව | 01 | 01 | 01 | 02 | 01 | 02 | 08 |


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පොත් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371




































Online shopping

**www.lol.lk**
**Learn Ordinary Level**

DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

# PAST PAPERS WIKI

## ප්‍රශ්නපත්‍ර පොත්
## ගෙදරටම ගෙන්ව ගන්න
## ඔන්ලයින් ඔඩර් කරන්න
## WWW.LOL.LK
## වෙත යන්න

# ONLINE BOOK STORE

An evening of fun for young readers

